# 2023 පෙබරවාරි මස 14 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2023.02.14 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 13.එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 21. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණි -

| | |
|---|---|
| 01. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රයානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2023 ජනවාරි  මස 03 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා

සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි,පිටු අංක 08හි අංක 12 යටතේ ඉර හඳගම සුභසාධක සමිතිය - වැටකේදෙණිය,වැටකේදෙණිය එක්සත් සුභසාධක සමිතිය නම සංශෝධනය රුවන්පුර සුභසාධක සමිතිය යනුවෙන් සටහන් විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

පිටු අංක 07 හි ප්‍රගති සහ ප්‍රජා යන වචනවල අක්ෂර දෝෂ සහිතයි.ඒවා සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි,ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2023.01.03 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට යටත්ව පිළිගතහැකි  සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2023.01.03 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට යටත්ව  ඒකමතිකව සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමාගේ විශේෂ  නිවේදන - ඇත

01.පළාත් පාලන ආයතන සඳහා සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තිය පෙබරවාරි මස පළමු සතියේ සිට ක්‍රියාත්මක කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා  විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරමි.

02.පළාත් පාලන ආයතන ඡන්ද විමසීම  -2023 මැතිවරණ කාල සීමාවේදී ප්‍රාදේශීය සභා අරමුදල් යොදාගෙන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධාන උපුටා දක්වමින් මහනුවර ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරී විසින් යොමුකර ඇති  ලිපිය සභාගත කරමි.

03. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 මැතිවරණ කාල සීමාවේදී පළාත් පාලන ආයතන මගින් ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන් සඳහා ආධාර ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස දන්වමින් ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරී විසින් යොමුකර ඇති  ලිපිය සභාගත කරමි.

**04.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් කසළ කළමනාකරණ මධ්‍යස්ථාන පරික්ෂා කිරීමේ විශේෂ වැඩසටහන යටතේ ඩෙන්මාර්ක් කසළ අංගනය සම්බන්ධයෙන් නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කරමින් යොමුකර ඇති ලිපිය සභාගත කරමි.**

**05.2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි මස 28 දිනට ප්‍රථම විගණනට ඉදිරිපත් කරන ලෙස දන්වමින් විගණන අධිකාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරමි.**

**06.රටේ පවතින අර්බුධකාරී ආර්ථික තත්ත්වය මත පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම සීමා කර ඇති බැවින් මාර්ග ඉදිකිරීම සඳහා සභාව මගින් ඉල්ලා ඇති අමුද්‍රව්‍ය ලබා දීමට හැකියාවක් නොමැති බව දන්වමින් සභාපති,මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යොමුකර ඇති ලිපිය සභාගත කරමි.**

**07.ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව භුක්ති විඳින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව සභාගත කරමි.**

**08.ත්‍රි රෝද රථ ගාස්තු අයකිරීම සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව සභාගත කරමි.**

**09.ආදායම් රැස්කිරීම සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව සභාගත කරමි.**

**10.2022-12-06 දින මහා සභා වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව සභාගත කරමි.**

**03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත**

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත**

**05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත**

**05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**2022.12.31 වන දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථීර කරනවා.

ගරු සභාපතිතුමා

2022.12.31 වන දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයන නිසා මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

තීරණය

2022.12.31 වන දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.ඒසඳහා ගරු මන්ත්‍රීවරයෙකු හෝ ගරු මන්ත්‍රීවරියකපත් කරගන්නාලෙස මා ගරු මහාසභාවෙන්ඉල්ලාසිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, 2022 වර්ෂයේ භාණ්ඩසමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එම්.ජී. ප්‍රසන්න විමල් මනතුංග මහතා සුදුසු බවට මා ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේමහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණයඃ-

ඒ අනුව 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහාප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එම්.ජී. ප්‍රසන්න විමල් මනතුංග මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩවල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුවක් අවශ්‍ය බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීවරයෙකු හෝ ගරු මන්ත්‍රීවරියක පත්කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,වෙන්දේසියට සතියකට පෙර සියලු මන්ත්‍රීවරුන්ට වෙන්දේසි නිරීමට තෝරාගෙන ඇති භාණ්ඩ ලැයිස්තුව ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩවල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා

අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා සුදුසු බවට මා ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා , ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය වෙනුවෙන් වෙන්දේසි කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී, විෂය නිලධාරී හා මුදල් අයකිරීමේ නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුවක් අවශ්‍ය බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීවරයෙකු හෝ ගරු මන්ත්‍රීවරියක පත්කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේමහතා

ගරු සභාපතිතුමනි,2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුවට අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා සුදුසුබවටමා ගරු මහාසභාවටයෝජනාකරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේපිළිබඳවවෙනත්අදහසක්ඉදිරිපත්නොවනබවපෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී, විෂය නිලධාරී හා මුදල් අයකිරීමේ නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියරෙහි තෙවන බිල්පත වන රුපියල් 5,664,222.27 ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු මහා සභාවට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා**

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

**ගරු සභාපතිතුමා**

**2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියරෙහි තෙවන බිල්පත වන රුපියල් 5,664,222.27 ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙම ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකර ගෙවීම් කිරීම සඳහාඅදාළබිල්පත් අප වෙත ඉදිරිපත් කර තිබෙනවා.සභාවේ තාක්ෂණ නිලධාරී ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මහතා ද ඒ සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු කරනවා.ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් සකසන ලද එම සෑම බිල්පතකින්ම ගෙවන ලද අත්තිකාරමෙන් සියයට දහය බැගින් අය කෙරෙනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා**
**ගරු සභාපතිතුමනි ,මෙතෙක් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව කරන ලද ගෙවීම් සම්බන්ධ විස්තර මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.**

**තීරණය**
**2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියරෙහි තෙවන බිල්පත වෙනුවෙන් රුපියල් 5,664,222.27 ක මුදලක් ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවටගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**05:01:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**2023 ජනවාරි මස 03 වන දින තීරණ අංක 05:01:03 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.**

**දැනට සම්මත වී ඇති හා පරිච්ඡින්න කළ යුතු යෝජනාව**

**පානීය ජල සුරක්ෂිතතාව පිළිබඳ අතුරු ව්‍යවස්ථාව " පානීය ජල සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම ,ජල මූලාශ්‍ර විධිමත් කිරීම ,අධීක්ෂණය කිරීම ,බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති වලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම "සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා විසින් 2022-12-22වන දින විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කරන ලද අතුරු ව්‍යවස්ථාන පනවා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

**නව යෝජනාව**
**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(iX) හා 126(XIII)යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122(1) උප වගන්තිය යටතේ ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල වන පරිදි පනවා ගැනිමට සුදුසු බවට හා ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කිරීමට යෝජනා කරමි.**

## ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාල ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාල ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාල ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.
2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) හා 126 (XIII) යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට බලතල පිරිනැමී ඇත.
3. මෙම අතුරු ව්‍යවස්ථාව ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.
4. ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුල පිහිටියාවූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාලව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.
   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම
   iii. ග්‍රාම නිලධාරී වසම
   iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
   vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)
5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනිම නොකළ යුතුය.
   i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැළසෙන ආකාරයට පවත්වාගෙන යාම.
   ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.

iii. විවෘත අවකාශය තුල ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.

iv. කැනීම් සිදු කිරීම

v. කිසියම් කානුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කානු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.

vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එකළුල්ලේ ගලා ඒමට සැළැස්වීම.

vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුලට කාන්දු වීමට ඉඩ හැරීම.

viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.

ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිතා කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.

x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.

6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළට මීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනිම නොකළ යුතුය.

i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැළසෙන ආකාරයට පවත්වාගෙන යාම.

ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.

iii. ස්නානය සඳහා භාවිතය.

iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.

v. විවෘත අවකාශය තුල ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.

vi. කැනීම් සිදු කිරීම

vii. කිසියම් කානුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.

viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.

ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් හා ගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛණයට සාරාණුකූල වූ බලපත්‍රයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10.1 ජලය බෙදාහැරීම ජල නල පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී ප්‍රාදේශීය සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) ජල යෝජනා ක්‍රමයට අදාල වන සියළු සංරචක ඇතුලත් සැළැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියළු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නල පද්ධතිය පෞද්ගලික දේපලක් මතින් යෙදවීමේ දී ඊට අදාල ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපලක් මතින් යෙදවෙන විටදී ඊට අදාල අධිකාරිත්වය විසින් ඊට අදාල අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාල තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10.2 ජලය බෙදාහැරීම බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුලත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ගැසට් පත්‍රයේ පලකිරීමෙන් පසුව වලංගු වන්නේය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියළු සංරචක ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාල වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.

v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.

vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.

viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥා පනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.

ix. ජල ව්‍යාපෘතියට අදාලව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරු වලට නම් ඇතුලත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත

ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුලත් කරන ලද අයෙකු විය යුතුය.

x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාල සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාල වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.

18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින්

මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාල වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාලව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාල බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.

    i. සභාපති
    ii. ලේකම්
    iii. තාක්ෂණික නිලධාරී
    iv. පරිසර නිධාරී
    v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

    කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සභායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දඩුවමකට යටත් විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුල ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා

කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් 20වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

ප්‍රාදේශීය සභාව යන්නෙන් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව ද,

සභාපතිවරයා යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධූරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධූරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,

අපද්‍රව්‍ය යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,

බලය පවරන ලද නිලධාරී යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,

ජලමූලාශ්‍රයක් යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘතිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

## <u>උපලේඛන අංක 1</u>

### <u>පානීය ජලය ලබා ගැනීම සඳහා ජලමූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය</u>

1. ඉල්ලුම් කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාල සමිතියේ ලියාපදිංචි අංකය
4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම (දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
iii. ජල මූලාශ්‍රෙය් ස්වභාවය
iv. ග්‍රාම නිලධාරී වසම
v. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| අ/අ | නම | ලිපිනය | ජා.හැ.අ |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| අ/අ | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්

ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිලි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දල සැලැස්ම

iii. ජල යෝජනා ක්‍රමයට අදාල වන සියළු සංරචක ඇතුලත් සැළැස්ම

iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නල පද්ධතිය පෞද්ගලික දේපලක් මතින් යෙදවීමේ දී ඊට අදාල ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපලක් මතින් යෙදවෙන විටදී ඊට අදාල අධිකාරිත්වය විසින් ඊට අදාල අවසරය ලබා දී ඇති ලේඛන

අයදුම්කරුගේ අත්සන

දිනය

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

<u>**උපලේඛන අංක 2**</u>

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. –
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

දිනය

.....................................

සභාපති
ගඟ ඉහළ කෝරළේ
ප්‍රාදේශීය සභාව

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි</u>

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(iX) හා 126(XIII)යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122(1) උප වගන්තිය යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අදාළ වන පරිදි පනවා ගැනිමට සුදුසු බවට හා ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවටත් යෝජනා කරනවා.අප ප්‍රාදේශීය සභාවෙන් සම්පාදනය කරන ජලය වඩාත් හොඳින් පිරිපහදුකර ලබාදීමට අපගේ අවධානය යොමු කරමින් පවතිනවා.නමුත් කෝටි දෙක තුනක පිරිවැයක් ඒ සඳහා දැරීමට සිදුවෙනවා.අපට අවම වශයෙන් ජල ව්‍යාපෘති දෙකක් සඳහා හෝ මුදල් ලැබුණහොත් මෙය යම්තාක් දුරකට සාක්ෂාත් කරගත හැකියි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි,මේ ජල මූලාශ්‍ර හඳුනා ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂණ සිදුකිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(iX) හා 126(XIII)යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122(1) උප වගන්තිය යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අදාළ වන පරිදි පනවා ගැනිමට සුදුසු බවට හා ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට දැඩි සේවා අවශ්‍යතාව සළකා රියදුරු තනතුරු 03ක් ,පුස්තකාල සහයක තනතුරු 02ක් ද පුස්තකාල කාර්යය සහයක තනතුරු 01ක් ද මාර්ග කම්කරු තනතුරු 03ක් විදුලි කාර්මික සහයක තනතුරු 01ක් ද වශයෙන් නව තනතුරු 10ක් මු.රෙ.71 යටතේ ඇති කරගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට දැඩි සේවා අවශ්‍යතාව සළකා රියදුරු තනතුරු 03ක් ,පුස්තකාල සහයක තනතුරු 02ක් ද පුස්තකාල කාර්යය සහයක තනතුරු 01ක් ද මාර්ග කම්කරු තනතුරු 03ක් විදුලි කාර්මික සහයක තනතුරු 01ක් ද වශයෙන් නව තනතුරු 10ක් මු.රෙ.71 යටතේ ඇති කරගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,සභාවේ පවතින වාහන ප්‍රමාණය අනුව ප්‍රමාණවත් රියදුරන් සංඛ්‍යාවක් නොමැතිවීම විශාල ගැටළුවක්ව පවතින බැවින් මෙම යෝජනාවට අනුව නව තනතුරු ඇති කිරීම සුදුසු බව මගේ අදහසයි.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් දැඩි සේවා අවශ්‍යතාව සළකා රියදුරු තනතුරු 03ක් ,පුස්තකාල සහයක තනතුරු 02ක් ද පුස්තකාල කාර්යය සහයක තනතුරු 01ක් ද මාර්ග කම්කරු තනතුරු 03ක් ද විදුලි කාර්මික සහයක තනතුරු 01ක්ද වශයෙන් නව තනතුරු 10ක් මු.රෙ.71 යටතේ ඇති කරගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:08 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2023 ජනවාරි මස 03 වන දින තීරණ අංක 06:03 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.

දැනට සම්මත වී ඇති හා පරිච්ඡින්න කළ යුතු යෝජනාව

අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය සඳහා වාස්තු විද්‍යා සැළසුම් ,ව්‍යුහ සැළසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම ,උපදේශන හා අධීක්ෂණ කටයුතු කිරීම වෙනුවෙන් උපදේශන ගාස්තු වශයෙන් පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 429.3 අනුව බිල්පත් වටිනාකමින් 5% ක වටිනාකම වන රු.435,284.32 ක මුදලක් ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

නව යෝජනාව

අසුපිනි ඇල්ල සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පතෙහි විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස එම දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට අනුව එම උපදේශන හා අධීක්ෂණ කටයුතු වෙනුවෙන් රු.526,724.10 ක මුදලක් එම විස්තරාත්මක බිල්පතේ සඳහන් කර ඇති අතර ඒ අනුව රු රු.526,724.10ක මුදලක් ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අසුපිනි ඇල්ල සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පතෙහි විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස එම දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට අනුව එම උපදේශන හා අධීක්ෂණ කටයුතු වෙනුවෙන් රු.526,724.10 ක මුදලක් එම විස්තරාත්මක බිල්පතේ සඳහන් කර ඇති අතර ඒ අනුව රු රු.526,724.10ක මුදලක් ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.පෙර මස ඉදිරිපත් කළ ගාස්තුව රු.435,284.32 ක් ලෙස දැක්වුනත් සවිස්තරාත්මක වාර්තාවෙන් එම මුදල සංශෝධනය වී තිබෙන බැවින් පෙර යෝජනාව පරිච්ඡින්න කිරීමට ඉදිරිපත් කර තිබෙනවා.මේ සම්බන්ධව වෙනත් අදහසක් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.එම නිසා මෙම යෝජනාව සභා සම්මත කරගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

අසුපිනි ඇල්ල සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පතෙහි විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස එම දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට අනුව එම උපදේශන හා අධීක්ෂණ කටයුතු වෙනුවෙන් රු.526,724.10 ක මුදලක් එම විස්තරාත්මක බිල්පතේ සඳහන් කර ඇති අතර ඒ අනුව රු රු.526,724.10ක මුදලක් ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:09 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අනුව කසළ අංගනයේ ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහාත් කසළ අංගනයට ප්‍රවේශවන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමටත් කසළ අංගනයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කරගැනීම සඳහා අත්‍යවශ්‍ය බොබ්කැට් යන්ත්‍රයක් ලබාගැනීමට කටයුතු කිරීම සඳහාත් කසළ අංගනය පිහිටා ඇති අක්කර දෙකක් ඉඩම වටා ආරක්ෂිත වැටක් සකස් කිරීම සඳහාත් ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ පස් දෙනෙකුගෙන් යුත් ප්‍රජා සංවර්ධන නිලධාරීන් කණ්ඩායමක් විසින් කසළ අංගනය නිරීක්ෂණය සඳහා පැමිණියා. අපේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය මෙම ප්‍රදේශයේ හොඳම කසළ කළමනාකරණ මධ්‍යස්ථානය බවටපත්ව තිබීම සම්බන්ධයෙන් මා ඉතා සතුටට පත්වෙනවා.ඔබතුමන්ලා සියලුදෙනාම මේ සඳහා විශාල සහයෝගයක් ලබාදීම පිලිබඳව ස්තූතිවන්ත වෙනවා.මෙම මධ්‍යස්ථානය තවදුරටත් ඉහළ තත්ත්වයකට ගෙනයාම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් යම් ප්‍රතිපාදන මුදලක් මේ සඳහා ලබාදෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.අදාළ නිරීක්ෂණ කණ්ඩායමඉදිරිපත් කරන ලද යෝජනා අනුව කසළ අංගනයේ ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහාත් කසළ අංගනයට ප්‍රවේශවන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමටත් කසළ අංගනයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කරගැනීම සඳහා අත්‍යවශ්‍ය බොබ්කැට් යන්ත්‍රයක් ලබාගැනීමට කටයුතු කිරීම සඳහාත් කසළ අංගනය පිහිටා ඇති අක්කර දෙකක ඉඩම වටා ආරක්ෂිත වැටක් සකස් කිරීම සඳහාත් ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන හෙයින් සභා සම්මත කරගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අනුව කසළ අංගනයේ ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහාත් කසළ අංගනයට ප්‍රවේශවන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමටත් කසළ අංගනයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කරගැනීම සඳහා අත්‍යවශ්‍ය බොබ්කැට් යන්ත්‍රයක් ලබාගැනීමට කටයුතු කිරීම සඳහාත් කසළ අංගනය පිහිටා ඇති අක්කර දෙකක් ඉඩම වටා ආරක්ෂිත වැටක් සකස් කිරීම සඳහාත් ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:10 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

උලපනේ ඩෙන්මාර්ක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන කාබනික පොහොර බාහිර පාර්ශවයක් වෙත අලෙවි කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ තත්ත්ව සහතිකයක් ලබාගැනීම අත්‍යවශ්‍ය බැවින් මෙම වසරේ පළමු කාර්තුව අවසන් වීමට ප්‍රථම ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් නියම කරනු ලබන මුදල් ගෙවා එම තත්ත්ව සහතිකය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

එම යෝජනාව මාවිසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

උළපනේ ඩෙන්මාර්ක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන කාබනික පොහොර බාහිර පාර්ශවයක් වෙත අලෙවි කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ තත්ත්ව සහතිකයක් ලබාගැනීම අත්‍යවශ්‍ය බැවින් මෙම වසරේ පළමු කාර්තුව අවසන් වීමට ප්‍රථම ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් නියම කරනු ලබන මුදල් ගෙවා එම තත්ත්ව සහතිකය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙතෙක් අප විසින් තත්ත්ව පරීක්ෂණය සිදුකළේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වුවත් දැන් අපට උපදෙස් ලැබී ඇති පරිදි ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් තත්ත්ව සහතිකය ලබාගත යුතුයි.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,වාර්ෂිකව මෙම තත්ත්ව සහතිනුකය ලබාගෙන කාබනික පොහොරවල අඩංගු සංඝටක පිලිබඳව ප්‍රමාණාත්මකව ඉදිරිපස ලේබලයෙහි සඳහන් කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

උළපනේ ඩෙන්මාර්ක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන කාබනික පොහොර බාහිර පාර්ශවයක් වෙත අලෙවි කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ තත්ත්ව සහතිකයක් ලබාගැනීම අත්‍යවශ්‍ය බැවින් මෙම වසරේ පළමු කාර්තුව අවසන් වීමට ප්‍රථම ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් නියම කරනු ලබන මුදල් ගෙවා එම තත්ත්ව සහතිකය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:11 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගම සමග පිලිසඳරක් - 2022 වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩ අවසන් ව්‍යාපෘති තුනක 2022-03-31 දිනට පසුව බිල්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් ගෙවීම් සිදුකළ නොහැකි බව ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2022-12-29 වන දින දැනුම් දී ඇත.එවකට රටේ පැවති අර්බුධකාරී ආර්ථික තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටළුව සහ ඉන්ධන හිඟතාවය නිසා 2022-03-31 දින වන විට අදාළ ව්‍යාපෘතිවල 60%ක පමණ ප්‍රමාණයක වැඩ අවසන් වී තිබීම හේතුවෙන් අදාළ දිනට බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව ,සභාව සමග ගිවිසුම්ගත වී ඇති පහත සඳහන් ව්‍යාපෘති සඳහා සභා අරමුදල් යොදවා ගෙවීම් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | මුදල රු. | මන්ත්‍රී කොට්ඨාසය | කොන්ත්‍රාත් සමිතිය |
|---|---|---|---|---|
| 01. | ගල්පාය විද්‍යාලයට අලුගොල්ල පාරේ සිට ලැන්ටන්හිල් බී කොටසට යන මාර්ගය සංවර්ධනය කිරීම | 484,298.07 | ගල්පාය | ගල්පාය ගොවි සංවිධානය |
| 02. | තැලිහුන්න පාසල අසලින් යන දංගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම | 759,039.63 | මල්වත්තගම | කුරුඳුවත්ත අත්කම් නිවාස ග්‍රාම සංවර්ධන සමිතිය |
| 03. | ගැමුණුපුර ජයන්ති විහාර ධර්ම ශාලාව අසලින් ඉහළට යන මාර්ගය සංවර්ධනය කිරීම | 381,058.63 | වැටකේදෙණිය | ගැමුණුපුර ග්‍රාම සංවර්ධන සමිතිය,උඩහේන්තැන්න. |
| | | 1,624,396.33 | | |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි,කොන්ත්‍රාත් සමිති සභාව සමග ගිවිසුම්ගතවී ඇති බැවින් මුදල් ගෙවීමට සභාව බැඳී සිටිනවා.ඒ අවධියේ පැවති භාණ්ඩ හිඟතාවය නිසා කොන්ත්‍රාත්කරුවන් භාණ්ඩ රැගෙන ආවේ කෑගල්ල,කොළඹ වැනි දුර බැහැර ප්‍රදේශවලින්.අවසාන මොහොතේ ඉතා අපහසුවෙන් මෙම ව්‍යාපෘති අවසන් කරනු ලැබූ අතර මෙම කොන්ත්‍රාත් සමිති සඳහා සාධාරණයක් ඉටුකිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් සභා අරමුදලින් මුදල් ගෙවීමට නම් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය අවශ්‍ය වෙනවා.නමුත් එතුමා ප්‍රකාශ කළේ පළාත් පාලන දෙපාර්මේන්තුව හරහා නොව සෘජුවම සභාව වෙත ලැබුණු ව්‍යාපෘතියක්වන බැවින් මේ සම්බන්ධව වගකීමක් දැරීමට නම් පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා ලැබීමට සළස්වන ලෙසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සභාවට ලැබුණු ව්‍යාපෘතියක් වන අතරරජයෙන් 2022-03-31 වන විට මෙම ව්‍යාපෘති අවසන් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබුවා.නමුත් පැවති ගැටළුකාරී තත්ත්වය යටතේ වුවත් මෙම ව්‍යාපෘති අවසන් කර තිබෙනවා.අදාළ අමාත්‍යංශ වෙත සිහිකැඳවීම් සිදුකර මෙම මුදල් ලබාගැනීමට කටයුතු කිරීම සුදුසුයි.අප අදාළ කොන්ත්‍රාත් සමිති සමග ගිවිසුම්ගත වුයේ මුදල් ප්‍රතිපූර්ණය වේය යන පදනම මතයි.එම නිසා අප අදාළ කොන්ත්‍රාත් සමිතිවලට මුදල් ගෙවීමට බැඳී සිටියද එම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, අදාළ කොන්ත්‍රාත් සමිති ගිවිසුම් අත්සන් කළේ ඊට අදාළ කොන්දේසි වලට එකඟව සහ ඒ වන විට වෙළඳපොළේ භාණ්ඩ හිඟයක් පැවති බවත් එයට මුහුණපෑමට සූදානමින් වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මෙම ව්‍යාපෘති පිළිබඳව පසුවිපරමක් සිදුවිය යුතුයි.නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් ප්‍රාදේශීය සභාවත් අතර සම්බන්ධිකරණයේ දුර්වලතාවයක් නිසා මෙය සිදුව තිබෙනවා.

ගරු සභාපතිතුමා

සභාව සමග ගිවිසුම්ගත වී ඇති නමුත් මුදල් ගෙවීම සඳහා මුදල් ප්‍රතිපූර්ණය වී නොමැති බැවින් සභාව සතු මුදල් ප්‍රමාණවත් වන්නේ නැහැ.එම නිසා අදාළ අමාත්‍යංශයට සිහිකැඳවීම් සිදුකර මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට උපරිමයෙන් උත්සහ කිරීම සුදුසු බව මගේ අදහසයි.

තීරණය

ගම සමග පිළිසඳරක් - 2022 වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද 2022-03-31 දිනට පසුව බිල්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් ගෙවීම් සිදුකළ නොහැකි බව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති වැඩ අවසන් ව්‍යාපෘති තුන සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යංශය වෙත සිහිකැඳවීම් සිදුකිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:11 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන ,ප්‍රවාහන,විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය මගින් යෝජනා ලබා ගන්නා ලද 2023 මධ්‍යම පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඉදිරිපත් කරන ලද ඩෙන්මාර්ක් - මහවිල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද රු.33,881,992.80 ක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන ,ප්‍රවාහන,විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය මගින් යෝජනා ලබා ගන්නා ලද 2023 මධ්‍යම පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඉදිරිපත් කරන ලද ඩෙන්මාර්ක් - මහවිල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද රු.33,881,992.80 ක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙම ඇස්තමේන්තුව අප සභාවෙන් සම්පාදනය කර අනුමත කර මාර්ග,විදුලිබල හා නිවාස ඉදිකිරීම් අමාත්‍යංශයට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබෙනවා.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඉදිරිපත් නොවන බැවින් සභා සම්මත කරගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන ,ප්‍රවාහන,විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය මගින් යෝජනා ලබා ගන්නා ලද 2023 මධ්‍යම පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඉදිරිපත් කරන ලද ඩෙන්මාර්ක් - මහවිල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද රු.33,881,992.80 ක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:12 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම්තුමාගේ 2022-12-15 දිනැති පළාත් පරිපාලන චක්‍රලේඛ අංක 01/ 2022 අනුව අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව දැනට තොරතුරු තාක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සේවා සපයනු නොලබන පළාත් පාලන ආයතන සඳහා වයඹ සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී ඇති CAT 2020 පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමට තීරණය කර ඇත. නමුත් දැනට අප ආයතනය NEKFA ආයතනයේ මෘදුකාංගය පවත්වාගෙන යනු ලබන බැවින් එම මෘදුකාංගය ඉදිරියටත් භාවිත කිරීමටත් එම මෘදුකාංගය මගින් මාර්ගගත සේවා සැපයීමටත් ඒ සඳහා අවශ්‍ය වියදම් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

දැනට මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සේවා සපයනු නොලබන පළාත් පාලන ආයතන සඳහා වයඹ සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී ඇති CAT 2020 පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමට තීරණය කර තිබෙන නමුත් දැනට අප ආයතනය NEKFA ආයතනයේ මෘදුකාංගය පවත්වාගෙන යනු ලබන බැවින් එම මෘදුකාංගය ඉදිරියටත් භාවිත කිරීමටත් එම මෘදුකාංගය මගින් මාර්ගගත සේවා සැපයීමටත් ඒ සඳහා අවශ්‍ය වියදම් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. NEKFA ආයතනයේ මෘදුකාංගය ලක්ෂ හතහමාරකට වැඩි පිරිවැයක් දරා ලබාගත් මෘදුකාංගයක් වන අතර එය දැනට යාවත්කාලීන කෙරෙමින් පවත්වාගෙන යනවා.දැනට බිල්ගෙවූ පසු කෙටි පණිවිඩයක් යැවීම,මාර්ගගතව බිල්පත් ගෙවීම වැනි කරුණු කිහිපයක් සිදුකරගැනීමට නොහැකිවුවත් එම මෘදුකාංගයෙන්ම එම සේවා සපයාගැනිමට හැකියාව පවතිනවා.එම සේවා සපයාගැනීමටත් කටයුතු කරන ලෙස මා විසින් ලේකම්තුමියට උපදෙස් දී තිබෙනවා. CAT 2020 පරිගණක මෘදුකාංගය පිළිබඳව විගණන අධිකාරීතුමියත් සෑහීමට පත්වූ නොවූ බැවින් ඉදිරියටත් NEKFA ආයතනයේ මෘදුකාංගයම පවත්වා ගෙනයාම වඩාත් සුදුසුය යන්න මගේ අදහසයි.නමුත් මෙම නව සේවා සම්පාදනය සඳහා යම් මුදලක් ගෙවීමට සිදුවිය හැකියි.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

පරිපාලන චක්‍රලේඛ අංක 01/ 2022 අනුව අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව දැනට තොරතුරු තාක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සේවා සපයනු නොලබන පළාත් පාලන ආයතන සඳහා වයඹ සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී ඇති CAT 2020 පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමට තීරණය කර ඇතත් දැනට අප ආයතනය NEKFA ආයතනයේ මෘදුකාංගය පවත්වාගෙන යනු ලබන බැවින් එම මෘදුකාංගය ඉදිරියටත් භාවිත කිරීමටත් එම මෘදුකාංගය මගින් මාර්ගගත සේවා සැපයීමටත් ඒ සඳහා අවශ්‍ය වියදම් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:13 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු 2023-02-24 දින සිට සේවයෙන් ඉවත්වීමට නියමිත බැවින් පුරප්පාඩුවන එම තනතුර සඳහා දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු 2023-02-24 දින සිට සේවයෙන් ඉවත්වීමට නියමිත බැවින් පුරප්පාඩුවන එම තනතුර සඳහා දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු 2023-02-24 දින සිට සේවයෙන් ඉවත්වීමට නියමිත බැවින් පුරප්පාඩුවන එම තනතුර සඳහා දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:14 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම සඳහා කුරුඳුවත්ත ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ස්ථාවර තැන්පතු ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| ගිණුම් අංකය | වටිනාකම |
|---|---|
| 88862874 | රු.5,000,000.00 |
| 88862862 | රු.5,000,000.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

මා විසින් එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 හා 2023 සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ගණනාවක වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කර තිබෙන නමුත් සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු එම ගෙවීම් කිරීම සඳහා කුරුඳුවත්ත ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු දෙකක මුදල් ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම සඳහා කුරුඳුවත්ත ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.10,000,000.00ක ස්ථාවර තැන්පතු ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසි යෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අයදුම්පත් කැඳවා ඇත. එහිදී එම සේවකයන් සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් මසකට රු. 22,500.00ක බැගින් අදාළ දීමනාව පමණක් ගෙවන බවටත් PL 1 කාණ්ඩයේ තනතුරු සඳහා මසකට ගෙවිය යුතු වැටුප් හා දීමනා අතර වෙනස සභා අරමුදල් ප්‍රතිපාදන මගින් කළමනාකරණය කටයුතු කරගත යුතු බවත් දන්වා ඇත.ඒ අනුව, PL - 1 කාණ්ඩයට අයත් පුස්තකාල සහයක තනතුරු 01ක් ,මාර්ග කම්කරු තනතුරු 03ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 04ක් වශයෙන් පුරප්පාඩු තනතුරු 08ක් සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් 08 දෙනෙකු බඳවා ගැනීම සඳහාත් එම එක් සේවකයෙක් සඳහා මසකට රු.17,050.00ක් බැගින් සේවකයන් 08ක් සඳහා වසරකට රු.1,636,800.00ක මුදලක් සභා අරමුදල් මගින් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අයදුම්පත් කැඳවා ඇත. එහිදී එම සේවකයන් සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් මසකට රු. 22,500.00ක බැගින් අදාළ දීමනාව පමණක් ගෙවන බවටත් PL 1 කාණ්ඩයේ තනතුරු සඳහා මසකට ගෙවිය යුතු වැටුප් හා දීමනා අතර වෙනස සභා අරමුදල් ප්‍රතිපාදන මගින් කළමනාකරණය කටයුතු කරගත යුතු බවත් දන්වා ඇත.ඒ අනුව, PL - 1 කාණ්ඩයට අයත් පුස්තකාල සහයක තනතුරු 01ක් ,මාර්ග කම්කරු තනතුරු 03ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 04ක් වශයෙන් පුරප්පාඩු තනතුරු 08ක් සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් 08 දෙනෙකු බඳවා ගැනීම සඳහාත් එම එක් සේවකයෙක් සඳහා මසකට රු.17,050.00ක් බැගින් සේවකයන් 08ක් සඳහා වසරකට රු.1,636,800.00ක මුදලක් සභා අරමුදල් මගින් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙය අග්‍රාමාත්‍ය ලේකම් ඇතුළු කමිටුවක් මගින් ඉදිරිපත් කර ඇති ලිපියක් අනුව පළාත් ප්‍රධාන ලේකම් විසින් අප වෙත යොමු කර තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි,අපට අවශ්‍යවන තනතුරු සඳහා බඳවාගෙන එම සේවකයන්ටත් අපටත් සාධාරණයක් ඉටුවන පරිදි කටයුතු කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා
ගරු සභාපතිතුමනි,වසර දෙකක් ඔවුන් රු.22500.00ක වැටුපකට සේවය කළා.මේ සම්බන්ධයෙන් සොයා බලා ඔවුන්ටත් සාධාරණයක් ඉටුවන ලෙසසභාවට අත්‍යවශ්‍ය රියදුරන්,සෞඛ්‍ය කම්කරුවන් එම තනතුරුවලම ස්ථිර කරන ලෙස ඉල්ලා සිටීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා
ගරු සභාපතිතුමනි,අපට රියදුරන් හා සෞඛ්‍ය කම්කරුවන්,මාර්ග කම්කරුවන්ප්‍රමාණවත් නොවීමේ ගැටළුව තිබෙනවා.එම නිසා අවශ්‍යතාවය අනුව අදාළ තනතුරේ නියමිත රාජකාරි ඉටුකිරීමට එකඟ නම් පමණක් එම තනතුරේ ස්ථිර කළ යුතු බව මගේ අදහසයි.

ගරු සභාපතිතුමා
මෙම සේවකයින් බඳවාගත හැක්කේ දැනට කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා පමණයි.ඒ අනුව අනුමත රියදුරන්ගේ පුරප්පාඩු නොමැති අතර පුරප්පාඩු තනතුරු සඳහා පමණක් මෙම බහු කාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීමට අයදුම්පත් කැඳවා තිබෙනවා.පවතින සේවා අවශ්‍යතාවය අනුව නව තනතුරු ඇති කිරීමටත් කටුයුතු කළ යුතුව පවතිනවා

තීරණය

අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීමේදී බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් මසකට රු. 22,500.00ක බැගින් අදාළ දීමනාව පමණක් ගෙවන බවටත් PL 1 කාණ්ඩයේ තනතුරු සඳහා මසකට ගෙවිය යුතු වැටුප් හා දීමනා අතර වෙනස සභා අරමුදල් ප්‍රතිපාදන මගින් කළමනාකරණය කටයුතු කරගත යුතු බවත් දන්වා ඇති බැවින් ඒ අනුව, PL - 1 කාණ්ඩයට අයත් පුස්තකාල සහයක තනතුරු 01ක් ,මාර්ග කම්කරු තනතුරු 03ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 04ක් වශයෙන් පුරප්පාඩු තනතුරු 08ක් සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් 08 දෙනෙකු බඳවා ගැනීම සඳහාත් එම එක් සේවකයෙක් සඳහා මසකට රු.17,050.00ක් බැගින් සේවකයන් 08ක් සඳහා වසරකට රු.1,636,800.00ක මුදලක් සභා අරමුදල් මගින් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

පැල්ලපිටිය කනත්ත හරහා දිවෙන ජනපද මාර්ගය ගම්සභා මාර්ගයක් ලෙස පාර මැන ගැසට් පළල් කර දෙන ලෙස සමිතිය මගින් කරන ලද ඉල්ලීම අනුව එම මාර්ගය අඩි 08ක පළලින් යුත් ගම් සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කොස්මැල්ලෑවක ප්‍රදේශයේ පවුල් හතළිස් පහක් පමණ භාවිතා කරන පැල්ලපිටිය කනත්ත හරහා දිවෙන ජනපද මාර්ගය ගම්සභා මාර්ගයක් ලෙස පාර මැන ගැසට් පළල් කර දෙන ලෙස සමිතිය මගින් කරන ලද ඉල්ලීම අනුව එම මාර්ගය අඩි 08ක පළලින් යුත් ගම් සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,මෙය පැල්ලපිටිය කනත්ත අසලින් යන මාර්ගය මාර්ගයේ මැනුම් සිදුකරන විට කනත්තත් මැනීමට කටයුතු කිරීම සුදුසු බව මගේ අදහසයි.

තීරණය

පැල්ලපිටිය කනත්ත හරහා දිවෙන ජනපද මාර්ගය ගම්සභා මාර්ගයක් ලෙස පාර මැන ගැසට් පළල් කර දෙන ලෙස සමිතිය මගින් කරන ලද ඉල්ලීම අනුව එම මාර්ගය අඩි 08ක පළලින් යුත් ගම් සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:03 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

පවතින දැඩි නියඟය හේතුවෙන් වැටකේදෙණිය ප්‍රදේශයේ ජනතාව දැඩි පානීය ජල හිඟයකට මුහුණපා ඇති බැවින් ජනතාවට සභාව මගින් හැකි පමණින් පානිය ජලය සැපයීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

ඔම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි,පවතින දැඩි නියඟය හේතුවෙන් වැටකේදෙණිය ගම්මානයේ ජනතාව නැවතත් ජල හිඟයෙන් පීඩා විඳිනවා.ආරම්භ කළ ජල ව්‍යාපෘති අසාර්ථකවීම නිසා මෙම ගැටළුවට නිසි විසඳුමක් මෙතෙක් ලබාදීමට හැකියාවක් ලැබුණේ නැහැ.මැතිවරණ කාලසීමාවක මෙම කටයුතු සඳහා සෘජු මැදිහත්වීමක් කළ නොහැකි බව මා දන්නවා.නමුත් ප්‍රදේශයේ ජනතාව විසින් කරන ලද ඉල්ලීම අනුව සහ ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් වැටකේදෙණිය ජනතාව වෙනුවෙන් සභාවේ ජල බවුසරය යොදවා පානීය ජලය ලබාදීමට හැකියාවක් ඇත්නම් එය සිදුකරදෙන ලෙස ගරු මහා සභාවෙන් ඉල්ලීමක් කරනවා.පසුගිය වසරේදීත් ජල හිඟයේදී ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම යටතේ ජලය ලබාදීමට කටයුතු සිදුකළා.ඒ සම්බන්ධයෙන් ද මාගේ ස්තුතිය පිරිනමනවා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, පවතින දැඩි නියඟය හේතුවෙන් වැටකේදෙණිය මෙන්ම තවත් වසම් කිහිපයක ම ජනතාව ජල හිඟයෙන් පීඩා විඳිනවා.මැතිවරණ කාලසීමාවක් බැවින් ජලය ලබාදීම අනෙක් පක්ෂවල අපේක්ෂකයින් මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් ලෙස සැළකීමටත් ඉඩ තිබෙනවා.නමුත් ප්‍රාදේශීය සභාවක් වශයෙන් බල ප්‍රදේශයේ ජනතාවගේ ගැටළුවලට විසඳුම් ලබාදීමේ වගකීම සභාව සතු වෙනවා.සැමට ජලය ව්‍යාපෘතිය අසාර්ථක වු අතර එම ව්‍යාපෘතිය නිසා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා විසින් ආරම්භ කළ ජල ව්‍යාපෘතිය නතර කිරීමට සිදුවූ නිසා අවසානයේ කිසිදු ජල ව්‍යාපෘතියක ප්‍රතිලාභ ලබන්නට ප්‍රදේශයේ ජනතාව අපොහොසත් වුණා.පවතින වියළි කාලගුණික තත්ත්වය ඉදිරියේ දී තවත් දරුණු විය හැකියි.එම නිසා ජනතා ඉල්ලීම් ඉදිරිපත්වන ආකාරය අනුව අවශ්‍ය ප්‍රදේශවලට සභාවේ ඉන්ධන ලබාගැනීමේ හැකියාව සහ මූල්‍ය තත්ත්වය ද සළකමින් හැකි පමණින් සහනයක් සැළසීමට කටයුතු කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි,අයිස්පිහිල්ලෙන් බොහෝදෙනා ජලය ලබා ගන්නා බැවින් එය සංරක්ෂණය කිරීමට කටයුතු කළයුතු අතර අළුගොල්ල ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජලයට අපද්‍රව්‍ය එක් වීමේ හැකියාවක් තිබෙනවා.සභාවෙන් ඒවා සම්බන්ධයෙනුත් අවධානය යොමු කිරීම සුදුසුයි.

තීරණය

පවතින දැඩි නියඟය හේතුවෙන් බල ප්‍රදේශයේ ඇතැම් කොට්ඨාසවල ජනතාව දැඩි පානීය ජල හිඟයකට මුහුණපා ඇති බැවින් එම ජනතාවගේ ඉල්ලීම අනුව සභාවේ මූල්‍ය තත්ත්වය අනුව සභාව සතු ජල බවුසරය මගින් පානිය ජලය සැපයීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07 කාරක සභා වාර්තා සළකා බැලීම

### 07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

**2023.02.07 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2023 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2023 ජනවාරි මස මුළු ලැබීම් රු:23,920,509.24ක් ද මුළු වියදම රු.20,073,883.26ක් ද විය. 2023 ජනවාරි මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය 2023.02.10 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.**

### 07:02 පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව

**2023 පෙබරවාරි මස 07වන දින පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.**

### 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

**2023-02-07 සිට 2023-02-10 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.**

| අනු අංකය | දිනය | ආදායකයා | ගෙවීම් විස්තරය | වවුචර් අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.02.07 | කැන්ඩි ලින්ක් හෝම්ස් , ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව ආදර්ශමත් පළාත් පාලන ආයතනයක් ලෙස තෝරාපත් කරගෙන ඇති බැවින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය නිරීක්ෂණයට පැමිණීමට නියමිත බැවින් දිරාපත් වූ පාපිසි වෙනුවට නව පාපිසි 10ක් ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම | 147 | | 11,800.00 |
| 2 | | ජේ.ජේ.එස්.ජේ. කිත්සිරි - පරිසර නිළධාරී | ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 148 | | 4,700.00 |
| 3 | | ජේ.ජේ.එස්.ජේ. කිත්සිරි - පරිසර නිළධාරී | දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා 2023.01.17 දින නවයාලතැන්නට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 149 | | 2,450.00 |
| 4 | | එන්.පී.එස්.එස්. සෝමතිලක -රියදුරු | ජනවාරි මස ගමන් වියදම් ගෙවීම | 150 | | 5,600.00 |
| 5 | 2023.02.08 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම, කොළඹ | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ රෝනියෝ යන්ත්‍රය ක්‍රියා විරහිත වීම නිසා නැවත අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 151 | | 42,318.05 |
| 6 | | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම , කොළඹ | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ටොෂිබා පිටපත් යන්ත්‍රයේ A4 ට්‍රේ එක අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 152 | | 3,811.55 |
| 7 | | අයි.පී. පුෂ්පලාල් - කා.කා.ස | නිවසේ අළුත්වැඩියා කටයුතුතක් සඳහා ආපදා ණය ලබා ගැනීම | 153 | 25.00 | 30,675.00 |
| 8 | | එම්.ඒ.ඒ. බාලසූරිය - කා.කා.ස | නිවසේ අළුත්වැඩියා කටයුතුතක් සඳහා ආපදා ණය ලබා ගැනීම | 154 | 25.00 | 30,675.00 |
| 9 | | ආර්.එම්. ඉනෝකා සෙනවිරත්න - මැහුම් උපදේශිකා | 2023 ජනවාරි මාසයේ වල්ලහගොඩ විහාරස්ථානයේ හා දොළොස්බාගේ විහාරස්ථානයේ පැවැත්වූ මැහුම් පාඨමාලාව සඳහා උපදේශක දීමනා ගෙවීම | 155 | | 25,000.00 |
| 10 | | සී/ස සමුපකාර රක්ෂණ සමාගම, ගම්පොල | CPZA 5420 මෝටර් ග්‍රේඩරයේ රක්ෂණ ආවරණ කාල සීමාව 2023.01.04 සිට 2024.01.05 දක්වා දීර්ඝ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 156 | | 27,325.34 |
| 11 | | නාවලපිටිය ඔටෝ කෙයාර් නාවලපිටිය | CPPF 7455 කැබ් රථයේ CV බූට්, වයිපර් බෙලේව්, පිටුපස සොකට් බුෂ් හා බ්‍රේක් බල්බ් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම | 157 | | 14,575.00 |
| 12 | | ABC ඔටෝ සර්විස් සෙන්ටර් , උලපනේ | CPZA 5189 බැකෝලෝඩර් යන්ත්‍රයේ පැය 6817 සේවා වාරය සිදුකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 158 | 25.00 | 189,225.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, කොළඹ | 2022 ඔක්තොම්බර්,නොවැම්බර්, දෙසැම්බර් මාස වලට අදාලව විශ්‍රාම වැටුප් බිල්පත ගෙවීම | 159 | | 18,056.01 |
| 14 | 2023.02 .10 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ දුරකථනයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2357689 | 160 | | 10,838.43 |
| 15 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියගේ දුරකථනයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2357117 | 161 | | 1,507.81 |
| 16 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඊ ඥාන පියස දුරකථනයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2357690 | 162 | | 829.07 |
| 17 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ දුරකථනයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2357510 | 163 | | 1,539.14 |
| 18 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඇත්ගාල උප කාර්යාලයේ දුරකථනයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2352123 | 164 | | 3,450.36 |
| 19 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපතිතුමාගේ කාර්යාලයේ දුරකථනයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2357082 | 165 | | 1,314.86 |
| 20 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ 2023.01.01 සිට 2023.01.31 දක්වා දුරකථන බිල ගෙවීම දු.අං.081-2357015 | 166 | | 2,012.81 |
| 21 | | සීමා සහිත ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමූපකාර සමිතිය | සීමා සහිත ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමූපකාර සමිතියේ ඉන්ධන පිරවුම්හලෙන් 2023.01.16 සිට 2023.01.31 දක්වා ලබා ගත් ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 167 | | 516,338.00 |
| 22 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ප්‍රධාන කාර්යාලයේ ලිපි තැපැල් කිරීමට අවශ්‍ය මුද්දර ලබා ගැනීමට මුදල් ගෙවීම | 168 | | 10,000.00 |
| 23 | | බී.ජී.ආර්. රසිකා දීපමාලි කුලරත්න - සංවර්ධන නිළධාරී | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියරේ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව 2023.02.08 දින පැවති වැඩ බිම් සාකච්ඡාව සඳහා සහභාගී වූ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට තේ ලබාදීමට අතින් වියදම් වූ මුදල ලබා ගැනීම | 169 | | 1,930.00 |
| 24 | | ජී.එස්.ජේ.එස්. පෙරේරා, යන්ත්‍ර ක්‍රියාකරු | ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 170 | | 10,745.00 |
| 25 | | පී.එච්.එන්. විමලසිරි - සංවර්ධන නිළධාරී | ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම | 171 | | 2,099.20 |
| 26 | | හේවගේ නුවන් - සංවර්ධන නිළධාරී | වරිපනම් රැස් කිරීමේ ජංගම කාර්යාල පැවැත්වීම වෙනුවෙන් ජනවාරි මාසය තුල සෙනසුරාදා දින 01ක් සේවයට වාර්තා කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම | 172 | | 1,049.66 |
| 27 | | එම්.එම්.ඩී.පී. බණ්ඩාර - සංවර්ධන නිළධාරී | කර්මාන්ත ව්‍යාපෘති 04ක ඇස්තමේන්තු භාරදීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 173 | | 831.00 |
| 28 | | ඩී.කේ.එස්.කේ. මැණිකේ - ක.සේ.නි | හොඳම ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම 2022 සහතික පත්‍ර ප්‍රදානය සඳහා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවට 2022.12.02 යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 174 | | 1,339.57 |
| 29 | | ටී.කේ.කේ. නවරත්න - ආයුර්වේද වෛද්‍ය නිළධාරී | ජනවාරි මස ජංගම සායනයට උලපනේ යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 175 | | 5,280.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 30 | | සභාපති රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, කොළඹ | ඩෙන්මාර්ක් කසල අංගනයේ සහ බරවාහන යන්ත්‍ර ක්‍රියාකරුගේ වැටුපෙන් අවකරණය කර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට බැරකරන ලද චෙක්පත් වෙනුවෙන් නැවත චෙක්පත් නිකුත් කිරීම | 176 | | 58,800.39 |
| 31 | | සමඟි ප්‍රජා මූල සංවිධානය, කුරුඳුවත්ත | කුරුඳුවත්ත මහජන පුස්තකාලයට සමඟි ප්‍රජා මූල සංවිධානයෙන් ජනවාරි මස ජලය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම | 177 | | 250.00 |
| | | **එකතුව** | | | **75.00** | **1,036,366.25** |

## 09. වෙනත්

### 1.නිවාඩු ඉල්ලීම්

**01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා විසින් අසනීප තත්ත්වය හේතුවෙන් සභා වාරයට සහභාගී විය නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.**

**එම ඉල්ලීම අනුමත කරන ලදී.**

ගරු සභාපතිතුමා

**අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදී. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 12.10 ට අවසන් කරන ලදී.**

**සභාපති**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**2023.02.14 වනදින ගඟ ඉහළ කෝරළේ**

**ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ය.**